

## 30

සුදු මලක් වෙලා මම මේ ලොවේ
ජීවිත සරසන්නයි
මල් මිටක් වෙලා මම සැම දෝතේ
පිදිලා මැලවෙන්නයි
මල් මාලයක් වී ගෙල සරසා
සිපගෙන රුව වෙන්නයි
මගේ ප්‍රාර්ථනා මේ ජීවිතේ
යාගික ආදරයයි

ලස්සනයි ලොව ලස්සනයි – මිනිසුන් මල් වුනදා
ලස්සනයි ලොව ලස්සනයි – අප මිනිසුන් වුනදා

සුව සිනහා මවා වත පෙමින් පුරා – සිරියා පතුරමිනා
මුතු කඳුළු නෙතේ පිස දමා පෙමින් – සතසම් අඬන දනා
ගිනි සුසුම් නිවා අවගති සිඳිමින් – අවියක් මම වෙමිනා
මගෙ ප්‍රාර්ථනා මේ ජීවිතේ – යාගික ආදරයයි

සැනසුමක් වෙලා මම මඳ සුළගේ
සැනසුම ගෙන හඳිනා
තනි අතක් අරන් මුදු දයා පෙමින්
පතුරම් සෙනෙහෙ සදා
සැනසුම් වදනින් සෙවූ පෙම් දහමින්
කිතු දෙව් පෙරුම් පුරා
මගේ ප්‍රාර්ථනා මේ ජීවිතේ
යාගික ආදරයයි